# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2178/22 - 2020 ජූනි මස 03 වැනි බදාදා - 2020.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44 (v)

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වූ නියමය

"ගිනිගත්හේන ශ්‍රී මංගල විනායගර් කෝවිල භාරයේ" භාරකරුවන්, එනම් :-

1. සෝමසුන්දරම් පිල්ලෙ රාජමානික්කම්,
2. සෝමසුන්දරම් පිල්ලෙ සුන්දර්ලිංගම්,
3. සෝමසුන්දරම් පිල්ලෙ මහාලිංගම්,

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ ඔවුන් සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර -

(අ) කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස්, කන්දයියා නීලකන්දන් විසින් සහතික කරන ලද 2014 ජනවාරි මස 25 දිනැති අංක 2161 දරන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "ගිනිගත්හේන ශ්‍රී මංගල විනායගර් කෝවිල භාරයේ භාරකරුවන්" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු යැයි ද ;


1A - G 032296 — 67 (2020/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළ මිලදී ගැනීම, භාරගැනීම, දීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම. ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැයි යයි ද ; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩුවල දී සහ නඩු කටයුතුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට හා විත්තිවාචක ඉදිරිපත් කිරීමට හා විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි මට පෙනී යන ආකාරයට කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

**නිමල් සිරිපාල ද සිල්වා,**
අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2020 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

06 - 124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.